## දුලබ පාඨක වින්දනයක් වෙනුවෙන්

# සරස්වතී උකටලීව

**සරස්වතී උකටලීව (කෙටි කතා)**
**කතෘ : කැත්ලින් ජයවර්ධන**
**ප්‍රකාශනය : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ**
**පිටු 130 යි**

**"තන්හාව විසින් පිරිවරන ලද ප්‍රජාවෝ මල පුඩුවෙහි බැඳුනු සාවා මෙන් හැපෙත්; හෙවත් ලියෙන් ගැහෙත් "**
**ධම්ම පදය - තෘෂ්ණා වර්ගය**

ජ්‍යේෂ්ඨ ලේඛිකා කැත්ලින් ජයවර්ධනගේ නවතම කෘතිය කියවීමේ භාග්‍ය මම මෑතකදී ලද්දෙමි.

මිනිස් මනස තුලට වැද එහි සඟවාගෙන ඇති සංකීර්ණ සිතුවිලි මංපැහැරීමේ සාහසික වූද ඉසියුම් වූද ප්‍රයත්නයක නියැලෙන අපූරු කෙටි කතා පහකින් සමන්විත මෙම නිර්මාණ සරණිය දුලබ පාඨක වින්දනයක් ගෙනදෙන්නකි.

ඔබ මිනිසකු නම්, තහනම් ගසේ සාම කුරුල්ලා, චරිතාපදානය, සිරකරුවෝද මනුෂ්‍යයෝය, කාල ශ්වේත පරම රමණී සහ

දිනවල මා අත්විඳිමින් සිටින්නේ මරණය ළඟාවනතුරු ජීවත් වීමේ දඬුවමයි....... ලෝකයේ කෲරතම දන්ඩනය දරුණුම වද බන්දනය වන්නේ මැරී මැරී ජීවත් වීම සඳහා මිනිසුන් යොමුකරවීමයි. ඒ සඳහා බල කිරීමයි." (28 වන පිටුව)

තහනම් ගසේ සාම කුරුල්ලා ද වෛවාරන්න සළු පිළි පළන්දා අන්දනවා ප්‍රදර්ශනයට තබන ලද විවාහය නැමැති රන් රුවෙහි සළු පිළි චන්ඩ මාරුතයට හසුවී ගසාගෙන ගිය අවස්ථාවක් පිළිබඳව ලියවුණු රසවත් ආත්ම කථනයකි. "මොකක්ද පව කියන්නේ ? හිත් රිදුමක්, පහර දීමක්, ඝාතනයක් නැති තැන කොහෙද පවක් ? සාමය සතුට ඉහ වහා ගිය භූමියක පව කොහොමද ලැගුම් ගන්නේ ? නාගයා බාසුරුට පෙනේ පිප්පුවේ, දෂ්ට කලේ කොන්දේසි, සාරධර්ම, පතිවෘත්තාව අකුරටම රැකුණ කාලෙදි. එහෙමනම්, ප්‍රේමය කියන්නේ ද්‍රෝහි වීමක්ද ?...... ප්‍රේමය අනියම්ද නැද්ද කියන එක අදාල නෑ....... බුදුහාමුදුරුවෝ කීවෙත් සතුට තමා පරම ධනය කියලලු."




සේවක, විශ්වාසවන්ත මිතුදම් අද අමිල වටිනාකම් පසාරු කරමින් උඩුදුවගොසින් පවතින උග්‍ර අසංවේදී රෝගී තත්වයක්ය. නිර්මාණයක සැබෑ අයිතිය කා සතුද ? නිර්මාණ කරුවා ඔහුගේ උරුමක්කාරයන්ට එසේ නැතිනම් නිර්මාණ මුදලාලිලාට එසේ නැතිනම් ඒවායේ පැවැත්මට ජීවයන් කවන රසික පාඨක ප්‍රජාවට නොහොත් රට ජාතියට ද ? මෙය සැබෑම අන්තෝ ජටා බහි ජටා තත්වයකි. ලයනල් වෙන්ඩ්ට් රඟහල, නව රඟහල, ජාතික පුස්ථකාලය ආදී කලාවේ ජයබිම්වල ජය පැන් පානය කළ අපේ නිර්මාණකරුවන් අද බුරුතු පිටින් අළුත් කඩේ උසාවි සංකීර්ණය අසළ රැස්කනු දැකීම අතිශය ඛේදජනකය.

"පරවී යන හෝපලු කුසුම් ඇතිරිල්ල මත වැතිර සිටි සරස්වතිය යලි යලිත් සුසුම් හෙළන්නට වූයේ කලාවේ ඉරණම ගැන සිත සිතාය. තමා විසින් මිනිසාට කලාව ප්‍රධානය කරන ලද්දේ ඔහුගේ සිත් සතන් සුමට කරලීමේ අරමුණින් ය. කලා කරුවා යනු සමාජයක පෙරගමන් කරුවාය. සමාජ සහකම්පනය කිරීමේ ශක්‍යතා රැඳී ඇත්තේ කළා කරුවාගේ මුණිවර සිතෙහිය. මනෝභාවයන්, මනෝවෘත්තීන් සැකසී ඇත්තේ වෛරයට ඊර්ෂියාවට මෙන්ම තරඟකාරීත්වයට ද වැද්දගත නොහැකිවන පරිදිය. එහෙත් ...... දැං කුමක් නම් සිදු වී ඇත්තේ ද ?"

කලාකරුවාගේ පරම සංතෘෂ්ටිය විය යුත්තේ තමන් දෙවියන්ගෙන් ලද නිර්මාණශීලී බව නැමැති තිළිණය බහුතර වූ සිත් සතන් ආලෝලනය කිරීම සඳහා යොදා ගැනීමයි. " කලාවේ පරම ධ්‍යනය බදා ගැනීම වෙනුවට බෙදා ගැනීම යන්න ඔවුනට ඉන්තේරුවෙන්ම අමතක වී තිබේ."

සරස්වතී උකටලීව, යනු එම කෙටි කතා හතයි.

ඔබ මිනිසකු නම් නැමැති ප්‍රථම කෙටි කතාව යෝජිත විවාහයකින් බන්ධන ගතවී නොබෝ කලකින්ම ඉච්ඡා භංගත්වයට පත්වූ මිනිසෙකුගේ නොසිතූ විරූ ඉරණම පිළිබිඹු කරන්නා වූ වාචික සමීප රූපයකි. මෙවන් තත්වයට පත්වන පුද්ගලයෙකුගේ ස්වභාවික ගැලවුම්කාරිය ලෙසින් පෙනී යන්නේ වෙනත් රන් රුවක්ය. "ප්‍රේමයේ වෙස් මුහුණ පැළඳ මිනිසකු වසඟයට පත් කරන්නේ හිරුට පවා ගිනි ඇවිලිය හැකි රාගයට යයි මම කියමි. දෙවියන් වහන්සේ හෝ ප්‍රජාපතී හෝ වෙනයම් බලවේගයක් හෝ ලෝකයේ අවිච්ඡින්න පැවැත්ම සඳහා රාගයම තෝරාගෙන ඇත්තේ ඒ නිසයි."

බහුතරයක් මිනිසුන්ගේ ජීවිත, විශේෂයෙන්ම විවාහ ජීවිත බොහෝවිට ආත්ම වංචාවකි. තමා අලාමුලාවට පත්කරන්නා වූ අවිනිශ්චිත හැඟුම්, ඉපිද මියයන්නා වූ ඊර්ෂියාව, කුහකකම, ආත්මාර්තය වැනි නිවට නියාලු බියගුලු මිනිස් හැඟුම් තත්පරයකට හුස්ම පිඹීමේ අනවර්ත ව්‍යවසායක මිනිසා යෙදී සිටියි. වෙනත් වචන වලින් කිවහොත් අප සැම වනාහි ලෝකය නැමැති වේදිකාව මත රඟ දක්වන නළු නිළි කැලක්ය අපේක්ෂා භංගත්වය සහ දුක ආවරණය කරමින් පායා නැගුණ ඔහුගේ සිහින සඳෙහි පළුවක් එක්තරා මොහොතකදී කවුදෝ විසින් ඉරාගෙන තිබිණ. සියල්ල කණපිට පෙරළුනේ මේ අනුවය. අංගුලිමාලයන්ට එරෙහිව පැණවුන රාජ නීතිය නම් බුද්ධ නීතය හමුවේ දන ගසනු ලැබීය. එනමුදු අප කතා නායකයාට සිදු වූයේ කුමක්ද ?. ඝාතකයකු බවට පත් වූ ඔහු සාන්තුවරයකු හෝ තවුසකු වීමේ වරම ලද්දේ නැත. "මේ

චරිතාපදානය නමැති කෙටි කතාව තුලින් කතුවරිය ඉස්මතු කරන්නේ ජීවිතයේ අප නොදකින, නොඑසේ නම් නොදුටුවා සිටින



සම්මානනීය ලේඛිකා
**ස්වර්ණකාන්ති රාජපක්ෂ**

පැත්තකි. අහස - පොළොව මෙන් දුරස්ථ වූ ඇති - නැති දෙලොවාන්තරව හමු වෙමින් - නොවෙමින් පවතින සිතිජ සීමාවක සිදුවන ගනුදෙනුවක් කතුවරියගේ සංවේදී ඇසට හසුවෙයි. සුදු පිරුවට ඇඳගත් බලසම්පන්න දේශපාලන චරිතයක ගෘහාභ්‍යන්තරයේ සිදුවන්නේ ඔවුන් ප්‍රසිද්ධ වේදිකාව මත නොඑසේ නම් රූපවාහිනී තිරය මත පෙනී සිටිමින් නිබඳව කරන්නා වූ හරබර දේශනවලටම ගැලපෙන ආදර්ශමත් ක්‍රියාවන්ද ?

"පාර්ලිමේන්තුවේ කුඩ මිට හරස් කරගන්න හතර පස්දෙනා අතරට පැනලා හැමදාමත් ධර්ම කතාවෙන් කප් එක ගහන්නේ සද්ධා සර්......

... වේදිකාවේ හරිමැද වාඩිවෙලා ඉන්නේ රාජ්‍ය නායකයා. ඊළඟට සද්ධා සර්"

නමුත්........

"ඉස්ටෝරු කාමරේ දොර උළුවස්ස ළඟ ඉඳන් පූස් අඩි තිය තියා එන්නේ සද්ධා සර්...... සුනන්දා බය වෙලා නැගිටිනවා......!

ඒ විතරක් යැ.
හසිත බේබිත් කී වතාවක් විශිෂ්ඨ ලෙසින් ලියැවුනු චරිතාපදානය කියවා ස්වාමි භක්තියෙන් ඔකඳ වී සිටි ප්‍රේමසිරිගේ නෙතට උණු කඳුලක් නැගෙන්නේ සුනන්දා වෙනුවෙනි. එම කඳුළු වැල රූරා වැටෙන්නේ පාඨකයාගේ කම්මුල දිගේය.

කාලශ්වේත, සිරකරුවෝද මනුෂ්‍යයෝ සහ පරම රමණී යන කෙටිකතා තුන හරහාද ජීවිතයේ විවිධ ඉසව්වල හුස්ම ගන්නා මේකාකාර ඇවතුම් පැවතුම් ඇති පුද්ගලයන් විමසුම් ඇසින් දකිමින් කතුවරිය සංකීර්ණ වූ මනුෂ්‍යත්වය වැමැති නාටකය විවිධාකාර භූමිකාවන්ට ආවේනික කුරිරුකම්, කුහකකම්, මෝඩකම්, තෘෂ්ණාව මෙන්ම ආදරය පරිත්‍යාගය ආදී ලක්ෂණ ගැන අපට ගැඹුරින් සිතන්නට මෙහෙයවන සටහන් තබා ඇත.

මෙම කෙටිකතා සමුච්චියට මාතෘකාව සපයමින් මෙහි අවසන් කථාව ලෙසින් රචිත සරස්වතී උකටලීව වනාහි අද නිර්මාණ ලෝකයේ යථාර්තය නිරුවත් කර දක්වන්නා වූ තත්වයක් තේමාව වශයෙන් යොදාගත් කතාවකි. මේ හරහා කතුවරියගේ සෝත හාසී සමාජදැක්ම විචිත්‍රවත්ව ඉදිරිපත්වී ඇත.

බුද්ධිමය දේපළ වශයෙන් නිර්වචනය වන්නා වූ කලා/ සාහිත්‍යමය නිර්මාණයක නෛතික අයිතිය නම් තත්වය අද ජනප්‍රිය පාඨයක්ය. එයද අපේ දේශපාලන පොරපිටිය මෙන්ම මාපිය - දූදරු, ගුරු ගෝල - ස්වාමි -

"මිනිස්සු දැං හරියට භාණ්ඩ වගේ. හරිම රළුයි. අකෘතඥයි."

සිනා තැලුම් විහිදුවමින් සිටි හිරු දෙවියන් එවර සරස්වතිය දෙස හෙලූ බැල්මෙහි වූයේ ප්‍රශ්නාර්තයකි.

"මටනම් අදහගන්නවත් බෑ. පුදුමම ප්‍රදර්ශනතාවයක් පුදුම හිතෙන පරිබෝජනවාදයක් !"

සංගීතය, සාහිත්‍යය, කවිය මේ කුමණ අංශයෙන් බැලුවත් අද දක්නට ලැබෙන්නේ සරළ, ආස්වාදනීය, රසපූර්ණ, භාවපූර්ණ නිර්මාණ සමාජයට දායාද කිරීමේ ඒකායන අදිශ්ඨානයකට වඩා ස්වකීය යශෝරාවය උත්කර්ශයට නගමින් ලක්ෂමිය වන්දනාවක යෙදෙන නිර්මාණකරුවන් බහුතරයක් නියැලී සිටින අනවර්ත වූද නිර්ලජ්ජී වූද අරගලයක යථාර්තයයි.

"බුද්ධිමය දේපල නඩු තීන්දුව උත්කර්ෂයට නගමින් උසාවි සංකීර්ණයේ හැසිරෙන නන්විද කලාකරුවන්ගේ ප්‍රීති ප්‍රමෝදාය දෙස සරස්වතී දිවෙස් හෙලා සිටියේ පුදුමයෙනි. බැලූබැල්මටම මුව "බුද්ධිමය දේපල යන යෙදුමෙහි ඇත්තේ ද බලවත් පරස්පර විරෝදී ස්වභාවයකි. දේපල සහ නීතිය නැතහොත් දේපළ සහ අධිකරණය අතරේ වන සහ සබඳතාව නම් පිළිගත හැකිය"

එහෙත් බුද්ධිය........?

බුද්ධිමය දේපළ ........?